326

RARE

# සිරි ගුණසිංහගේ පද්‍ය කාව්‍ය නිර්මාණ පිළිබඳ අධ්‍යයනයක්

ඩබ්.ඒ.ආර්.එච්.වංශතිලක
ලියා පදිංචි අංකය:-මාශාපි/දප/සිං/96/27



| ප්‍රවේශ අංකය | 326 |
| --- | --- |
| වර්ග අංකය | |



කැලණිය විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

2001 ජූනි

# සාරාංශය

1950 ගණන්වල දී සිංහල නිසඳැස් පද්‍ය කාව්‍ය ක්ෂේත්‍රයේ මහත් ආන්දෝලනයක් ඇති කළ කවියකු ලෙස සිරි ගුණසිංහ වැදගත් වෙයි. සිංහල පද්‍යයේ අංග කිහිපයක ම සැලකිය යුතු වෙනස්කම් ඇති කළ එම කවියාගේ නිර්මාණ පිළිබඳ ව පුළුල් අධ්‍යයනයක් මෙහි දී කර ඇත. සිංහල පද්‍යයේ වස්තු විෂය. දෘෂ්ටිය. භාෂාව. ආකෘතිය සංකේත. උපමා රූපක. රිද්මය යන විවිධ අංශවල මහත් විපර්යාසයක් කළ. මේ කවියාගේ කාව්‍ය නිර්මාණ පිළිබඳව පුළුල් විමර්ශනයක් මේ අධ්‍යයනයෙන් කර තිබේ. මේ කවියාගේ ආභාසය පසුකාලීන කවීන් කෙරේ විවිධ අංශවලින් ලැබී තිබෙන හෙයින්. ඒ සම්බන්ධයෙන් ද විමර්ශනයක් කර ඇත්තේ ය.

කොළඹ යුගයේ පැවති සඳැස් කාව්‍ය සම්ප්‍රදාය නිශේධනය කරමින් 1946 දී නව කාව්‍ය සම්ප්‍රදායක් සිංහල පද්‍ය ක්ෂේත්‍රයෙහි බිහිවිය. ඒ නිසඳැස් හෙවත් නිදහස් පද්‍ය සම්ප්‍රදායයි. 1946 දී ජී.බී. සේනානායක සූරිහු ගද්‍ය හෝ පද්‍ය නොවන රචනා අටක් "පළිගැනීම" කෙටිකතා සංග්‍රහයට ඇතුළු කළහ. ඒ අවස්ථාවේ දී සේනානායක ඒවා සලකන ලද්දේ. ගද්‍යයට ද. පද්‍යයට ද අතර නිබන්ධ විශේෂයක් වශයෙනි. ජී.බී. සේනානායක විසින් ආරම්භ කරන ලද නිදහස් පද්‍ය සම්ප්‍රදාය නියම ස්වරූපයෙන් හඳුනාගෙන. එය මෙරට ප්‍රචලිත කරන ලද්දේ සිරි ගුණසිංහයන් විසිනි. ඔහුගේ පද්‍ය කාව්‍ය නිර්මාණ පිළිබඳ ව පුළුල් අධ්‍යයනයක් මෙහි දී කර ඇත.

පළමුවැනි පරිච්ඡේදයෙන් සිංහල නිසඳැස් කාව්‍යයේ ආරම්භය ගැන සාකච්ඡා කෙරේ. නිසඳැස් පද්‍ය ආරම්භයෙහි දී බලපෑ දේශීය හා විදේශීය ආභාසයන් පිළිබඳ ව මෙහි දී අවධානය යොමුවේ.

සිරි ගුණසිංහගේ කාව්‍ය නිර්මාණවල විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව අධ්‍යයනය කිරීම දෙවැනි පරිච්ඡේදයෙන් සිදුවෙයි. සමාජයේ සෑම තරාතිරකම පුද්ගල අත්දැකීම් කවියාගේ පද්‍යවලට වස්තු විෂය වෙයි. කොළඹ යුගයේ පිළිගත් කාව්‍ය සංකල්පනා ප්‍රතික්ෂේප කළ ගුණසිංහ. තමා අවට වූ පරිසරයේ සුන්දර හා

අසුන්දර අත්දැකීම් පදනම් කරගෙන තම කාව්‍ය නිර්මාණ කළ අයුරු සාකච්ඡා වෙයි.

ගුණසිංහගේ පද්‍ය නිර්මාණවලින් හෙළිවන දාර්ශනික පසුබිම පිළිබඳ ව තෙවැනි පරිච්ඡේදයෙහි දී සාකච්ඡා වේ. කාව්‍යයේ දී ශබ්ද රසයට වඩා අර්ථ රසය කෙරෙහි වැඩි අවධානයක් යොමුකළ මොහුගේ. පද්‍ය කාව්‍යයන්හි දෘෂ්ටිය පිළිබඳ ව ගැඹුරින් අධ්‍යයනය කොට ඇත.

සතරවැනි පරිච්ඡේදයෙන් සිරි ගුණසිංහගේ පද්‍ය කාව්‍යයන්හි භාවිතා කර ඇති භාෂාව පිළිබඳ ව විස්තර වෙයි. ලේඛන ව්‍යවහාරයෙන් මෙන්ම. කතා ව්‍යවහාරයෙන් ප්‍රයෝජන ගත් කවියකු වූ. ඔහුගේ නිර්මාණවල භාෂාව යෙදීමේ කුසලතාවත් අධ්‍යයනය කර තිබේ.

පස්වැනි පරිච්ඡේදයේ දී සමකාලීන කවීන්ගේ හා සිරි ගුණසිංහගේ පද්‍ය සංග්‍රහ පිළිබඳ ව සංසන්දනාත්මක ව සාකච්ඡා වෙයි. සිරි ගුණසිංහ පද්‍ය රචනා කරන්නට එළඹුණ අවධියේ සිටි වෙනත් කවීන් විසින් උපයුක්ත වස්තු විෂය. ආකෘතිය. භාෂාව. සංකේත. උපමා. රූපක හා රිද්මය. ගුණසිංහගේ කාව්‍යයන් සමග සංසන්දනාත්මක ව විග්‍රහ කෙරේ. ජී.බී. සේනානායක. ගුණදාස අමරසේකර. මහගමසේකර හා විමල් දිසානායක වැනි සමකාලීන කවීන්ගේ නිර්මාණ හා ගුණසිංහගේ පද්‍ය නිර්මාණ පිළිබඳ ව මෙහි දී සංසන්දනාත්මක ව විමර්ශනය කර තිබේ.

මේ නිබන්ධනයේ හයවැනි පරිච්ඡේදයෙන්. ගුණසිංහ කවියාගේ ආභාසය පසුකාලීන කවීන්. කෙරේ බලපා ඇති ආකාරය විග්‍රහ කොට ඇත. පසුකාලීන කවීන් වූ මඩවල එස්. රත්නායක. නන්දසේන රත්නපාල. සරත් අමුණුගම. සුනන්ද මහේන්ද්‍ර. සෝමරත්න බාලසූරිය වැනි නිසඳැස් පරපුරේ ප්‍රථම භාගයේ කවීන්ට ගුණසිංහගේ ආභාසය ලැබුණු ආකාරය මෙහි දී සාකච්ඡා කර තිබේ. 1970 න් පසු බිහිවූ නිසඳැස් දෙවැනි කවි පරපුරට ද ගුණසිංහගේ ආභාසය ලැබී ඇති ආකාරය විචාරාත්මක ව විග්‍රහ කර ඇත්තේ ය. මොනිකා රුවන්පතිරණ. පරාක්‍රම කොඩිතුවක්කු. බුද්ධදාස ගලප්පත්ති. දයාසේන ගුණසිංහ හා රත්න ශ්‍රී විජේසිංහ යන කවීන්ගේ නිර්මාණයන්හි හා ගුණසිංහගේ කාව්‍ය නිර්මාණයන්හි

අන්තර්ගතය, භාෂාව ආකෘතිය යන අංශවල දක්නට ලැබෙන සමානතා මෙන්ම, වෙනස්කම් මේ පරිච්ඡේදයෙන් සාකච්ඡා කොට තිබේ.